**මාර්ග සංවර්ධන අධිකාරිය - 2023**

----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග සංවර්ධන අධිකාරියේ (“අධිකාරිය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට පටහැනිව අධිවේගී මාර්ග 07 ක එකතුව රු.මි 4,866.06 ක් වූ පිරිවැයට අදාළ සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල ක්ෂය වටිනාකම පිළිවෙළින් රු.මි.92.69 ක් සහ රු.මි.115.31 ක් අඩුවෙන් සටහන් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මි.92.69 කින් සහ පෙර වර්ෂ ලාභය රු.මි.115.31 කින් අධි ගණනය වී තිබුණි. | අධිවේගී මාර්ග වලට 2023 වර්ෂයේදී කල එකතු කිරීම් මෙම අධිවේගී මාර්ග, අධිකාරියට භාර දෙන ලද එක් එක් වර්ෂයන්හි, අවසාන දිනයට උපලබ්ධි වී නොතිබූ අතර එකතු කිරීම් වලට අදාල වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී හටගෙන තිබුණි. ඒ අනුව එම වටිනාකම් 2023 වර්ෂයේ එකතු කිරීමක් ලෙස ගිණුම් පොත්වල සටහන් කර අදාළ ක්ෂය ගණනය කිරීම් සිදු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ඡේද අංක 80 (ඇ) ට පටහැනිව 2024 වර්ෂයේ දී දෝෂ වගකීම් කාලය ඉකුත් වන රඳවා ගැනීමේ මුදල් රු.මිලියන 15.42 ක් ජංගම වගකීම් ලෙස හඳුනා නොගෙන, ජංගම නොවන වගකීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, රු.මිලියන 59.39 ක රඳවා ගැනීම් ශේෂය තුළ ඇතුළත් රු.මිලියන 29.23 කට අදාළ දෝෂ වගකීම් කාලය ඉකුත් වන දිනයන් සහ කොන්ත්‍රාත්තුව නිම කළ දිනයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ජංගම නොවන වගකීම් ලෙස හඳුනා ගැනීමේ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන අතර රඳවා ගැනීමේ ශේෂ තුළ ඇතුළත් වන රු.මිලියන 29.23 ට අදාළ දෝෂ වගකීම් කාලය ඉකුත් වන දිනයන් සහ කොන්ත්‍රාත්තුව නිම කරන දිනයන් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධිකාරියට අයත් පිරිවැය රු.මිලියන 1342.07 ක් වූ වාහන 370 ක් හා පිරිවැය රු.මිලියන 56.69 ක් වූ ගොඩනැගිලි 107 ක් 2021 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. එම වාහන හා ගොඩනැගිලි තවදුරටත් අධිකාරිය භාවිතා කරමින් පැවති නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති අනුව පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අදායම ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සිදුකරන බව සඳහන් කර තිබුණද ඒ අනුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රමිත අංක 07 හි ඡේද අංක 71 අනුව වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය අස්ථිත්වයට වත්කමේ ඇති අපේක්ෂිත උපයෝගීතාවය මත නිර්වචනය කරන අතර එය පළපුරුද්ද මත පදනම් වූ විනිශ්චයාත්මක දෙයකි. එම නිසා වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව ඇස්තමේන්තුගත දෝෂ නිවැරදි කර ඉදිරියේදී අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම ඡේද අංක 92 (ආ) අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තවමත් භාවිතා කරන වත්කම් වල ධාරණ අගය හෙළිදරව් කිරීමටද ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 04 වගන්ති අංක 11 ට පටහැනිව වාණිජ බැංකු මගින් ලබාගත් ණය මුදලින් අධිවේගී මාර්ග 05 ක් සහ වෙනත් ව්‍යාපෘති වෙත ලබා දී තිබුණු වටිනාකමට අදාළ 2023 දෙසැම්බර් 31 දින වන විට පැවති රු. මිලියන 29,240 ක් වූ පොලිය අදාළ ව්‍යාපෘති මගින් ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන මගින් ගැලපුම් නොකර අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කල මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කිරීම හේතුවෙන් එම අගයෙන් කෙරීගෙන යන වැඩ වටිනාකම අධිගණනය වී පොලී වියදම අඩුවෙන් සටහන් වී තිබුණි. | ණය ලබා ගැනීම අධිකාරිය සහ අදාළ දේශීය බැංකුව අතර ගිවිසුම්ගතව සිදු වූ නිසා අදාල ණය අධිකාරියේ පොත් වල සටහන් විය යුතුය. ප්‍රමිත අංක 04 හි ඡේද අංක 18 අනුව ණය ගැනීම් පිරිවැය වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතු නිසා, ණය පොළිය අධිකාරියේ ගිණුම් වල කෙරීගෙන යන වැඩ (WIP) යටතේ දක්වනු ලබයි. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 27 ට පටහැනිව අධිවේගී මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ (EOM&M) අංශය වෙත සමාලෝචිත වර්ෂයට පෙර හුවමාරු නොවන ගනුදෙනු හරහා ලද එහෙත් වත්කම් බාරදෙන ලද පාර්ශවය බාරදෙන ලද දිනය හා වටිනාකම නිශ්චිතව හඳුනා | සම්පූර්ණයෙන් ක්ෂය වූ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලැබෙන සම්පූර්ණ වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතයට ඇතුලත් කිරීම ප්‍රමිත අංක 07 හි ඡේද අංක 52 අනුව සිදු කර ඇති අතර, වත්කම් තක්සේරු කිරීම සමාලෝචිත වර්ෂයේදී සිදුකල බැවින් පෙර වර්ෂයන්ට අදාලව ක්ෂය ගැලපීම ප්‍රමිත අංක 03 හි | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට තොරතුරු නොමැති වීම හේතුවෙන් ගිණුම් මඟින් අත්හැර තිබුණු වත්කම් අයිතම 10 කට අයත් වටිනාකම රු.මිලියන 4,350.35 ක් වූ දේපළ පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂයේ දී සිදු කළ ප්‍රත්‍යාගණන ගැළපීමක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව, අදාළ වටිනාකම අතීතානුයෝගී ගැළපීමක් මඟින් ප්‍රාග්ධන අයභාර ලෙස ප්‍රාග්ධන සංචිත යටතේ හඳුනා ගැනීම වෙනුවට ප්‍රත්‍යාගණන සංචිත ලෙස සටහන් කිරීම හේතුවෙන් ප්‍රාග්ධන සංචිත වටිනාකම එම අගයෙන් ඌන ගණනය වී ප්‍රත්‍යාගණන සංචිත වටිනාකම අධි ගණනය වී තිබුණි. තවද, ඉකුත් වර්ෂයන්ට අදාළ ක්ෂය වියදම් පෙර වර්ෂ ගැලපුම් ලෙස සටහන් කර නොතිබුණි. | ඡේද අංක 57 අනුව පෙර කාලපරිච්ඡේද වරද නිවැරදි කිරීම අතීතානුයෝගීව කිරීම ප්‍රායෝගික නොවන නිසා පෙර වර්ෂයන්ට අදාල ගැලපුම් සටහන් සිදු නොකරන ලදී. | |
| (ඊ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 42 අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියේ භාවිතයේ පැවති මෝටර් වාහන 380 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමිත අංක 07 හි ඡේද අංක 42 මඟින් ප්‍රත්‍යාගණනය සහ ඡේද අංක 27 මඟින් පිරිවැය රහිතව හෝ නාමික අගයට අත්පත්කරගත් වත්කම් සාධාරණ අගයට හඳුනාගෙන ගිණුම් තැබිය යුතු බව දක්වා ඇත. ඒ අනුව මෙම මෝටර් වාහන 380 න් වාහන 24ක් 2024 මාර්තු මස ජ'නල් අංක 347/J03 මඟින් ප්‍රත්‍යාගණනය කර ඇති අතර ඉතිරි වාහනද ප්‍රත්‍යාගණනකර මෙම වසරේදී ගිණුම්වල සටහන් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 58 වගන්තියට පටහැනිව අධිකාරියේ මුළු වත්කම් වලින් සියයට 63 ක් නියෝජනය කරන එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ග වල බොක්කු, මාර්ග ඉවුරු, මාර්ග පෘෂ්ඨය, මාර්ග සංඥා ඇතුලු විවිධ අංගයන් සඳහා වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන | අධිවේගී මාර්ග පිරිවැය මත ක්ෂය අනුපාතය තීරණය කර ඇති අතර ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියේ වත්කම් තක්සේරු පද්ධති මොඩියුලය තුලින් ඵලදායී ජීවිත කාලය එකිනෙකට වෙනස් වන අංග සඳහා ඵලදායී ජීවිත කාලය මෙන්ම ක්ෂය අනුපාතයන්ද ගණනය කළ හැකි අතර ඉදිරියේදී මෙම පද්ධතිය හරහා මෙම කාර්යය නිම කිරීමට අපේක්ෂා | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විටත් කටයුතු කර නොතිබුණු අතර එකම ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කර තිබුණි. ඒ අනුව එම වත්කම්වල සැබෑ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපණය නොවුණි. | කෙරේ. | |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 51 ට පටහැනිව අධිකාරියට අයත් ගොඩනැගිලි 789 න් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර තිබුණු ගොඩනැගිලි ප්‍රමාණය 560 ක් පමණක් විය. | ප්‍රමිත අංක 07 හි ඡේද අංක 51 අනුව “වත්කම් පන්තිය ප්‍රත්‍යාගණනය කෙටි කාලයක් තුල සම්පූර්ණ වීමට හා ප්‍රත්‍යාගණනයන් යාවත්කාලීනව පවත්වා ගැනීමට යටත්ව ගොඩනැගිලි චක්‍රීය පදනම මත ප්‍රත්‍යාගණනය කර ඇති අතර ප්‍රත්‍යාගණනයට තවත් ඉතිරිව ඇත්තේ ගොඩනැගිලි 229 කි. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (එ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි වගන්ති අංක 15 අනුව, තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට දැක්විය යුතු වුව ද, භාවිතයට ගත නොහැකි පිරිවැය රු.මිලියන 26.68 ක් වූ වාහන අමතර කොටස් තොගය ඒ අනුව අගය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමිත අංක 09 වගන්ති 31 හා 32 අනුව හුවමාරු නොවන ගනුදෙනු මාර්ගයෙන් ලැබූ තොග විශේෂිත හඳුනා ගැනීම් ක්‍රම භාවිතා කරමින් පිරිවැය නිශ්චය කල යුතුය. ඒ සඳහා පත් කරන ලද කමිටුව පසුගිය කාලයේ රට තුල ඇති වූ තත්ත්වයන් හේතුවෙන් ක්‍රියාකාරී වී නොතිබුණි. එම නිසා ඉදිරියේදී නව කමිටුවක් පත්කර අදාල නිර්දේශ ලබා ගැනීම සිදු කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (ඒ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 14 හි 16 ඡේදය අනුව, සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ විස්තර හා සම්බන්ධිත පාර්ශව සමඟ වූ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.2 (iv) යටතේ අදාල හෙළිදරව් කිරීම සිදු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (ඔ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 38 වන ඡේදය ට පටහැනිව අධිකාරිය විසින් අදාළ සේවාදායක කාර්යය (Client work) සඳහා වැයකරන වියදමට සියයට 20 ක ලාභාන්තිකයක් එකතුකර රු.මිලියන 612.54 ක | ප්‍රමිත අංක 16 හි 39 වන ඡේදය අනුව නිම කිරීමේ අදියර මත යම් දිනකට ඉටු කරන ලද වැඩ වලට දරණ ලද පිරිවැය කොන්ත්‍රාත් පිරිවැය ලෙස හඳුනාගෙන ඇති අතර ඡේද අංක 33 පරිදි කොන්ත්‍රාත් පිරිවැය සමඟ ලාභය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව අයභාරය හඳුනාගෙන ඇති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සේවාදායක ආදායම් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. | නිමකර ඇති සමානුපාතයට අයභාරය හඳුනාගෙන ඇත. | |
| (ඕ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි ඡේද අංක 72 අනුව, ඉඩම් වෙනම වත්කමක් ලෙස ගිණුම් තැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අධිවේගී මාර්ග ව්‍යාපෘති මඟින් අධිකාරිය වෙත පවරා දී තිබුණු පිරිවැය රු. මිලියන 49,214.5 ක් වූ ඉඩම් වෙනම වත්කමක් ලෙස හඳුනානොගෙන අධිවේගී මාර්ග යටතේ ගිණුම්ගතකර තිබුණි. | අදාල අධිවේගී මාර්ගයන්හි තොරතුරු ඉඩම් අංශයේ තොරතුරු පද්ධතියේ යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ඉඩම් වෙනම වත්කමක් ලෙස ගිණුම්තබා ඇති බව අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අර්ධ වශයෙන් නිමකළ ජාතික මාර්ග වෙනුවෙන් දරන ලද රු.මිලියන 147,153 ක් කෙරීගෙන යන වැඩ (WIP) ලෙස හඳුනාගෙන තිබු අතර, එම මාර්ග පූර්ණ වශයෙන් නිමකිරීමෙන් අනතුරුව වියදම් සේ ලියාහරින බවත් මේ නිසා අධිකාරියේ අතිරික්තයට හෝ ඌනතාවයට වන බලපෑම මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය නැවත ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ ප්‍රදාන ලද පසු හිලව් කරන බවත් මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් වලින් හෙළිදරව් කර තිබුණි. මේ අනුව වියදම් සේ ලියා හැරීම සහ ඊට අදාල ආදායම කාලපරිච්ඡේද දෙකක හඳුනාගැනීම ගිණුම්කරණයේ ගැලපුම් සංල්පයට පටහැනි විය. | කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති අගය ජාතික මහා මාර්ග වලට අයත් නොවන මාර්ග වෙනුවෙන් දරණ ලද පිරිවැයක් වන අතර මෙම මාර්ග පූර්ණ වශයෙන් නිම කර නොමැති නිසා වියදම් ලෙස ලියාහැරීමට අදාල ගැලපුම් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් නියමකර ඇති කරුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් සංශෝධනයට ලක් නොකල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් A සහ B ශ්‍රේණි වලට අදාළ මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් 12,225 ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දිනට මාර්ග 285 කට අයත් කිලෝමීටර් 3,267 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, අධිකාරිය සතු A සහ B ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 8958 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය මගින් ඉතිරි වී ඇති මාර්ගයන්හි ප්‍රාග්ධනිත කිරීමේ කටයුතු 2024 වසරේදී ආරම්භ කිරීමට නියමිත අතර 2024 වසරේදී කි.මී.2000 ක්ද 2025 වසරේදී කි.මී.4000 ක්ද හා 2026 වසරේදී කි.මී.5500 ක්ද වශයෙන් නිම කිරීමට අපේක්ෂිතය. | ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීමට කඩිනම් පියවර ගත යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. |
| (ආ) | 2021 සහ 2022 වර්ෂ වල දී ඇවර කරන ලද ව්‍යාපෘති 03 ක් මඟින් අධිකාරිය වෙත පවරා දී තිබූ වටිනාකම රු. මිලියන 24,331.83 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂය තුළ දී අතීතානුයෝගී ගැළපීමක් ලෙස සටහන් නොකර සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම (Revenue from Non-Exchange Transactions) සහ ස්ථාවර වත්කම් එම වටිනාකමින් අධි ගණනය වී තිබුණි. | මධ්‍යම අධිවේගී මාර්ග II ව්‍යාපෘතියෙන් ලද තොරතුරු මත එම පිරිවැයෙන් කොටසක් 2022 වසරේදී ගිණුම්ගත කර ඇති අතර මෙම ව්‍යාපෘති තුනම 2022.12.31 දිනට ඇවර කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අධිකාරියට භාර දී ඇති නිසා මෙම වත්කම් සමාලෝචිත වර්ෂය තුළ ලද වත්කම් ලෙස සලකා ගිණුම්ගත කර ඇත. | අධිකාරියට අයත් වත්කම් නිවැරදිව ගිණුම්ගතකර ඇති බව අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර තහවුරුකරගත යුතුය. |
| (ඇ) | අධිකාරිය විසින් මාර්ග නඩත්තු හා අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා 2015 වර්ෂයේ සිට භාවිතා කරනු ලබන පිරිවැය රු.මිලියන 100.15 ක් වූ පරිගණක තොරතුරු පද්ධතීන් 11 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම පරිගණක තොරතුරු පද්ධතීන් ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියේ උප පද්ධතීන් වන අතර ඒවා විවිධ අරමුණු ඔස්සේ යාවත්කාලීන කර ඇති අතර අදාල විස්තර ලබාගැනීමෙන් පසු ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අධිකාරියට අයත් තොරතුරු පද්ධති සම්පූර්ණයෙන් හා නිවැරදිව ගිණුම්ගතකර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී ලද ප්‍රාග්ධන ස්වරූපයේ රජයේ ප්‍රදාන (Government Capital Grant) රු.මිලියන 101,285.66 ක් අයහාර ප්‍රදාන (Recurrent Grant) ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් ප්‍රාග්ධන ප්‍රදාන ඌන ගණනය වී අයහාර සංචිත අධිගණනය වී තිබුණි. | සෘජුවම ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රදාන ලෙස හඳුනාගත හැකි ප්‍රදාන පමණක් ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇති අතර එසේ නොමැති ප්‍රදාන, අයහාර අයහාර ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත. කෙසේ වුවද ප්‍රදානයන් නිසි පරිදි සමාලෝචනය කර අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | රජයේ ප්‍රදාන නිවැරදිව ගිණුම්ගතකර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික කළ යුතුය. |
| (ඉ) | අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛන හා රේඛීය අමාත්‍යාංශයේ අක් මුදල් නිදහස් කිරීමේ ලේඛනය අනුව අයිතම 04 කට අදාළ රජයේ ප්‍රදාන වටිනාකමෙහි රු.මිලියන 15,829.43 ක වෙනසක් පැවතුණි. | මෙම වෙනසට ප්‍රදාන හේතුව බැඳුම්කර මගින් ලබා දෙන ලද රු.මිලියන 39,956.9 ක මුදලක් වර්ෂයේ ලද ලැබීමක් ලෙස සටහන් කිරීම වන අතර මෙම වැය ශීර්ෂයට ලැබෙන මුදල් ප්‍රාග්ධන ලැබීම් යටතේද ගිණුම්ගත කර ඇති අතර වර්ෂය තුළ ලද මුළු ලැබීම්වල එකතුව රු.මිලියන 93,552.57 කි. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර රේඛීය අමාත්‍යාංශයේ තොරතුරු සමග සංසන්ධනයකර නිවැරදිව ගිණුම්ගතකර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික කළ යුතුය. |
| (ඊ) | අධිකාරිය විසින් ලබාගත් ණය සඳහා දේශීය බැංකු 02 ක් වෙත සමාලෝචිත වර්ෂයට අදාළව එකතුව රු.මි.9.42 ක දඩ පොලී ගෙවා තිබුණු අතර එම අගය තුළ ඇතුළත් රු.මි. 5.97 ක් සමාලෝචිත වර්ෂයට අදාල වියදම් ලෙස ගලපා නොතිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අධිගණනය වී ගෙවිය යුතු පොලී වියදම් අවගණනය වී තිබුණි. | අදාල බැංකු සමඟ සාකච්ඡා කර එම දඩ පොළිය ඉවත් කර ගැනීමට උත්සාහ ගත් නිසා පොළී සඳහා වෙන් කිරීම හෝ අනාවරණය කිරීම සිදු නොකල අතර අවසානයේ දී බැංකු සමඟ ගිවිසුම්ගත වී ඇති ආකාරය අනුව එම දඩ පොළිය ගෙවීමට සිදු විය. | දඩ පොලී ගෙවීම සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදුකර වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග කි.මී. 6426 ක් ප්‍රතිසංස්කරණය, අලුත් වැඩියාව සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා වැය කළ රු.මිලියන 3,810ක් ද ඇතුළත්ව, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට වැයකල (2020, 2021,2022 සහ 2023 වර්ෂයන්හි) රු.මිලියන 147,153 ක් කෙරීගෙන යන වැඩ (Work in Progress) යටතේ සටහන් කර තිබුණි. | ඉදිරියේදී මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර අවශ්‍ය ගැලපුම් සිදු කරනු ලබන අතර2023 වසරේදී කෙරීගෙන යන වැඩ ලෙස සටහන් කර ඇති අගයෙන් වියදම් ලෙස ලියා හැරීම සිදු නොකරන ලද නිසා වත්කම් ජනරජයේ ගිණුම් වලින් අත්හැරීමක් සිදු වී නොමැත. | ජාතික මහා මාර්ග වලට අයත් නොවන මාර්ග වෙනුවෙන් දරණ ලද පිරිවැය ජනරජ ගිණුම් මගින් මග නොහැරෙන පරිදි ගිණුම්තබන බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2020, 2021, 2022 හා සමාලෝචිත වර්ෂය යන වර්ෂයන් හී දී විවිධ දේශීය/විදේශීය මූල්‍යාධාර මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 09 ක් විසින් අධිකාරිය වෙත පවරා දී තිබුණු එකතුව රු.මි.22,587 ක් වූ වත්කම් ගිණුම්ගතකර නොතිබුණි. | තොරතුරු ලද පසු ගිණුම්ගත කරනු ලැබේ. | ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු වත්කම් භාරදීම හා භාරගැනීම ගිණුම්ගත කිරීම සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. අවිධිමත් ලෙස වත්කම් භාරදුන් හා භාරගත් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතුකළ යුතුය. |
| (එ) | නව කැලණි පාලම් ව්‍යාපෘතියට අදාල රු.මිලියන 220.36 ක් වූ අනෙකුත් වත්කම්වල වටිනාකම අදාල වත්කම් කාණ්ඩය යටතේ ප්‍රාග්ධනිත කිරීමට පියවර ගෙන නොතිබුණි. | රු.මිලියන 220.36 ක් වූ අනෙකුත් වත්කම් 2024 වසරේ අප්‍රේල් මස අධිකාරියේ ගිණුම් වලට ප්‍රමිත අංක 07 ඡේද අංක 27 අනුව ගිණුම් ගත කර ඇත. | අධිකාරියට අයත් වත්කම් නිවැරදිව ගිණුම්ගතකර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික විය යුතුය. |
| (ඒ) | මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීමේ දී අත්කර ගත් ඉඩම් වලට අදාළව 38(අ) ගැසට් නිවේදනය නිකුත් කළ දින සිට වන්දි මුදලට අදාළ ප්‍රථම වන්දි ගෙවීම සිදු කරන දිනය දක්වා සියයට 07 ක වාර්ෂික පොළියක් අදාල වන්දි හිමියන් වෙත ගෙවිය යුතුය. එහෙත් අධිකාරියේ ඉඩම් අංශය වෙත වන්දි හා පොළී මුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන වවුචර්පත් වලට අදාළව පමණක් ගෙවිය යුතු වන්දි හා පොළිය හඳුනා ගන්නා බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති මුළු ව්‍යවස්ථාපිත ව්‍යවස්ථාපිත වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල අධිකාරිය විසින් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අදාළ වන්දි හා පොළී මුදල් 38(අ) ගැසට් නිවේදනය අනුව සකස්කර ඉල්ලුම් කරන අතර, ඒ අනුව ගෙවිය යුතු වන්දි හා පොළී මුදල හඳුනාගැනීම සිදුකරයි. 2023 හා 2024 වසරේදී වන්දි මුදල් විශාල ප්‍රමාණයක් ගෙවා නිමකර ඇති බැවින් ඉතිරි වන්දි හා පොළී මුදල් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. | එක් එක් අධියරයන්ට සම්බන්ධවන නිලධාරීන්ගේ වගකීම හා පවත්වාගතයුතු වාර්තා නිශ්චය වන පරිදි ඉඩම් අත්කරගැනීම, වන්දි සහ ගෙවීම පිළිබඳ පරිපාටීන් සකස්කර අනුගමනය කළ යුතුය. |
| (ඔ) | කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට අදාළව තෙලහපාත පොලිස් ගොඩනැගිලි සමඟ ඉදිකර තිබූ පිරිවැය රු.මි. 13.55 ක් වූ භෝජනාගාර (Canteen) ගොඩනැගිල්ල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | මේ වන විට අදාල ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන වටිනාකම 2024 වසරේ අප්‍රේල් මස ගිණුම්ගත කර වත්කම් ලේඛන යාවත්කාලීන කර ඇත. | අධිකාරියට අයත් වත්කම් නිවැරදිව ගිණුම්ගතකර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය -අදියර II ව්‍යාපෘතියට අදාළ ක්ෂය වටිනාකම රු.මි.1371.02 ක් විය යුතු වුවත් එය රු.මි. 1,660.14 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්යේ ලාභය රු.මි.289.12 කින් ඌන ගණනය වී තිබුණි. | මාස තුනක ක්ෂය වැඩිපුර ගිණුම් වල සටහන් කර ඇති අතර එය 2024 වසරේ අප්‍රේල් මාසය තුළ නිවැරදි කර ඇත. | වත්කම් ක්ෂය නිවැරදිව ගිණුම්ගතකර ඇති බව අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර තහවුරුකරගත යුතුය. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති විලම්භිත වත්කම්(Deferred assets) වටිනාකම රු.මිලියන 172.65 ක් ණයගැති වටිනාකම යටතේ දැක්වීම හේතුවෙන් ණය ගැති වටිනාකම එම අගයෙන් අධිගණනය වී තිබුණු අතර විලම්භිත වත්කම් එම ප්‍රමාණයෙන් අවගණනය වී තිබුණි. | විලම්භිත වත්කම් වටිනාකම වෙනමම අයිතමයක් වශයෙන් ජංගම වත්කම් යටතේ දැක්වීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතුය. |
| (ග) | විදේශ ණය හා දේශීය වාණිජ බැංකු ණය මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතින් හි අවශ්‍යතාවය සඳහා මිල දී ගන්නා සහ ව්‍යාපෘති අතරේ හුවමාරු වන ඉන්වෙන්ට්‍රි ගත විය යුතු වත්කම් මිල දී ගන්නා සහ හුවමාරු වන අවස්ථාවන් හි දී අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනයේ යාවත්කාලීනව සටහන් වන ක්‍රමවේදයක් සකස් කර නොතිබීම නිසා වත්කම් ඒකක 17,883 ක වටිනාකම ගණනයකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වත්කම් අධිකාරියට භාරදෙනු ලබන්නේ ව්‍යාපෘතීන් අවසන් වීමෙන් පසුව වන අතර, ව්‍යාපෘති වත්කම් භාරදීමට අදාලව නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 216 හා 250 පරිදි අදාල වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි මගින් නියමකර ඇති ආකාරයට භාණ්ඩ ලැබීම් හා නිකුතුකිරීම් සඳහා නිවැරදි ආකෘති භාවිතාවන බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. |
| (ච) | පශ්චාද් සේවක ප්‍රතිලාභ (Post-Employment Benefit) වටිනාකම ගණනය කිරීම සඳහා යොදාගනු ලබන අනාගත සේවා කාලය වට්ටම් කිරීමේදී සිදු වූ දෝෂයක් හේතුවෙන් අධිකාරියට අදාළ පාරිතෝෂික වියදම රු. මිලියන 344.48 ක් අඩුවෙන් ද, අධිවේගී මාර්ග මෙහෙයුම් හා කළමනාකරණ අංශයට අදාළ පාරිතෝෂික වියදම රු. මිලියන 35.05 ක් වැඩියෙන් ද, සටහන් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට | අනාගත සේවා කාලය වට්ටම් කිරීමේදී සිදු වූ දෝෂය නිවැරදි කිරීම 2024 අප්‍රේල් මස ජ'නල් අංක 079/J04 මගින් සිදු කරන ලදී. | පශ්චාද් සේවක ප්‍රතිලාභ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව ගිණුම්තබා ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදාළ පාරිතෝෂික වියදම රු. මිලියන 309.43 කින් අවගණනය වී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම අගයෙන් අධිගණනය වී තිබුණි. | | |
| (ජ) | අධිකාරියට අයත් මාර්ග 04 ක් හා පාලමක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමට අදාළව 2023 ජනවාරි 01 දිනට කෙරී ගෙන යන වැඩ (WIP) වටිනාකම යටතේ රු.මි.383.98 ක් සටහන්කර තිබියදී එම මාර්ග සහ පාලම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරා තිබූ රු.මි.147.16 ක සංවර්ධන වියදම් වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා කෙරී ගෙන යන වැඩ වටිනාකම එම අගයෙන් ඌන ගණනය වී තිබුණි. | මෙම වියදම් පෙරමුසු මිලදී ගැනීම සඳහා සිදු කරන ලද ගෙවීම් වන අතර එම මාර්ග පිළිබඳව සොයා බලා ඒවා කෙරීගෙන යන වැඩ වටිනාකම යටතේ සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයේ වියදම් නිවැරදිව ගිණුම්ගතකර ඇති බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් සහතික විය යුතුය. |

### 1.5.4 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මි) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මි) | වෙනස (රු.මි) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත්කල මූල්‍ය ප්‍රකාශනයන් හි දැක්වෙන ණයගැති ශේෂය රු.මි.45,615.18 ක් සහ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛන වල ඇතුළත් (Shedule) ණයගැති ශේෂ එකතුව රු.මි.48,563.77 ක් වීම හේතුවෙන් අදාළ ශේෂයන් අතර රු.මි. 2,948.59 ක වෙනසක් පැවතුණි. | 45,615.18 | 48,563.77 | 2,948.59 | උපලේඛන වල අගයන් නිවැරදි අතර ඇමුණුම 07 හි සඳහන් උපලේඛනවල අගයන් නිවැරදි විය යුතුය. | වත්කම් උපලේඛණ නිවැරදි බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික විය යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන් හි අධිවේගී මාර්ග යටතේ ප්‍රාග්ධනිත කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන 49,212.91 ක් වූ අතර ඉඩම් අංශය විසින් පවත්වාගෙන යන තොරතුරු අනුව එම වියදම රු.මිලියන 32,368.75 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සහ ඉඩම් අංශය විසින් පවත්වාගෙන යනු ලබන තොරතුරු අතර රු.මිලියන 16,844.16 ක වෙනසක් පැවතුණි. | 49,212.91 | 32,368.75 | 16,844.16 | අදාල අධිවේගී මාර්ගයන්හි තොරතුරු ඉඩම් අංශයේ තොරතුරු පද්ධතියේ යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අනුරූපී වාර්තා සැසඳීමට ලක්කළ යුතුය. |

**1.5.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය, එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර සමූහයට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර සමූහයට අදාල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම සම්බන්ධයෙන් කරුණු ගිණුම් ප්‍රතිපත්ති වල සටහන් අංක 2.2 හි දක්වා ඇත. | සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති සමග අනුගත වන මූල්‍ය ප්‍රකාශන පාලිත සමාගම් පිළියෙල කළ යුතුය. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් කොන්ත්‍රාත් කාර්යන් සඳහා ලබා දී තිබූ රු. මිලියන 41,691.68 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් | වැඩ පූර්ව අත්තිකාරම් සුරක්ෂණ කල් ඉකුත් වන දිනය, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කළ දිනය, කාලය දීර්ඝ කිරීම් අනුමත කළ දිනය | පවතින පද්ධතිය වැඩිදියුණු කල යුතුය එම තොරතුරු අදාල අංශ වෙතින් ලබා ගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ උපලේඛන පිළියෙලකර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතු අතර එම ලියවිලි විගණනයට ලබාදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක සෘජු පාලන හිමිකම | සියයට 99 ක සෘජු පාලන හිමිකමට අදාල කොටස් සහතික | මෙම සමාගම මේ වන විට ඈවර කිරීමේ ක්‍රියාවලියේ පවතින අතර හිමිකම පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මගනැගුම ඉමල්ෂන් සමාගමේ අයිතිය තහවුරුකර ගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී කටයුතුකළ යුතුය. |
| (ඇ) | වටිනාකම රු.මි.3424.45 ක් වූ ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, පරිගණක හා ගෘහ උපකරණ | වත්කම් මිල දී ගත්/පවරා ගත් දින | රු.මිලියන 199.07 ක් වූ යන්ත්‍රෝපකරණ 2023 වර්ෂයේදී නොවැම්බර් මස ප්‍රත්‍යාගණය කර ඇති අතර දින සඳහන් නොමැති වත්කම් සියල්ලම 2023 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇත. | වත්කම් මිලදීගත්/ පවරාගත් දින පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | මහාමාර්ග දෙපාර්තමේන්තුව අවසන් කිරීමේදී අධිකාරිය වෙත පවරා දෙනු ලැබූ වටිනාකම රු.මිලියන 525.01 ක් වූ වත්කම් | වත්කම් ලේඛන | මීට වසර 40 කට පමණ පෙර භාර දෙන ලද අදාල වත්කම් සම්බන්ධ විස්තර (ගොඩනැගිලි හැර) අධිකාරිය සතුව නොමැත. | අදාළ වත්කම් ලේඛන පිළියෙලකර ඇති බවට අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා වත්කම් කළමනාකරණ) විසින් තහවුරුකරගත යුතු අතර එම ලේඛන විගණනයට ලබාදිය යුතුය. |
| (ඉ) | මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමේ සංවර්ධන වියදම් ගිණුමට හර හා බැර කර තිබූ රු.මිලියන 437.35 ක් වූ වටිනාකම් | ගණනයකල ආකාරය දැක්වෙන මූලාශ්‍ර ලේඛන හා අදාල වියදම් මෙම ගිණුම යටතේ දැක්වීමට හේතුවූ කරුණු | කාර්තුමය පෙරමුසු විකුණුම් හා පෙරමුසු නිෂ්පාදන වියදම් අතර වෙනස අදාල වැය ශීර්ෂය සමඟ ගැලපීම මෙමගින් සිදු කර ඇත. | අදාළ මූලාශ්‍රලේඛණ විගණනයට ඉදිරිපත් කළ යුතුය. මූලාශ්‍ර ලේඛන සකස්කිරිමකින් තොරව ජ'නල් වවුචර අනුමත කළ නිළධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා 2017 මාර්තු 15 දින නිකුත් කළ අංක 32 අතිරේකය (Supplement - 32) ට පටහැනිව එහි දැක්වෙන සීමාවන් ඉක්මවා 2020 වර්ෂයේ දී නිලධාරීන් 16 දෙනෙකු සඳහා රු.මිලියන 19.49 ක මුදලක් සහ 2021 වර්ෂයේ දී නිලධාරීන් 15 දෙනෙකු සඳහා රු. මිලියන 4.49 ක මුදලක් වශයෙන් එකතු වන වටිනාකම රු.මිලියන 24.38 ක මුදලක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවදුරටත් අයවිය යුතු මුදල රු.මිලියන 6.14 ක් වී තිබුණි. | මාර්ග කි.මී.100,000 ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදන කටයුතු වලට අදාලව මෙම ගෙවීම් සිදුකර ඇති අතර මේ වන විට අදාල නිලධාරීන්ට කාර්තුවක් තුළ ගෙවීම් කළ හැකි උපරිම සීමාව ඉක්මවා ගෙවීම් නොකරන අතර, වැඩිපුර ගෙවන ලද මුදල් අදාල සාමාජිකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ II බාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, ගෙවීම් අනුමතකල සහතික කල හා ගෙවීම් කල නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් එකතුව රු.මි. 45,615 ක් වූ ණයගැති ශේෂයෙන් රු.මි. 124.84 ක් වර්ෂ 02 ත් 05 ත් අතර කාලයක සිටද, රු. මි.420,288, ක් වර්ෂ 05 ත් 10 ත් අතර කාලයක සිටද, රු.මි. 0.71 ක් වර්ෂ 10 ට වැඩි කාලයක සිටද අයකරගෙන නොතිබුණි. | ණයගැති ශේෂයෙන් රු. මිලියන 1265 ක් 2024 අප්‍රේල් මස වන විට අය කර ගෙන ඇති අතර<br>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ආයෝජන මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල වන රු.මිලියන 430ක් අය නොවී පවතී.<br>වසර 10කට වඩා වැඩි මුදල් නොගෙවන අයට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇති අතර අදාල නඩුව මෙතෙක් අවසන් වී නොමැත. | ලැබිය යුතු මුදල් ශේෂ අදාල ණය ගැතියන් වෙතින් සනාථ කර ගත යුතුය. එසේ සනාථ නොවන ශේෂයන්ට අදාළ සේවා පරිපාටීන්ගෙන් බැහැරව සැපයීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූලව කටයුතුකළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්, එකතුව රු.මි. 568.31 ක් වූ ණයහිමි ශේෂයෙහි ඇතුළත් රු.මි. 30.91 ක් වර්ෂ 02 ත් 05 ත් අතර කාලයක සිටද, රු.මි. 5.9 ක් වර්ෂ 05 ත් 10 ත් අතර අතර කාලයක සිටද, රු.මි. 6.08 ක් | වසර 02ත් 05ත් අතර රුපියල් මිලියන 30.91 තුල ඇතුලත් වන්නේ මිරිජ්ජවිල කර්මාන්තපුරයේ සැපයුම් සඳහා ගෙවියයුතු රු. මිලියන 8.7ක් ද ඉදිරි වසර වලට අදාලව ලැබී ඇති රුපියල් මිලියන 1.2ක කුලී මුදල්ද | අදාළ සේවාවන් සැපයීම හා ඊට අදාළ පරිපාටීන් අනුගමනය කිරීමකින් පසු ණය හිමියන් හඳුනාගන්නා බවත් ගෙවිය යුතු ශේෂ නිසි වර්ගීකරණයක් සහිතව වාර්තාකර ඇති බවත් අදාළ |

| | | |
|---|---|---|
| වර්ෂ 10 කට වැඩි කාලයක සිටද නිරවුල්කර නොතිබුණි. | වන්දි ගෙවීම සඳහා NKB ව්‍යාපෘතියෙන් ලබා දී ඇති රු. මිලියන 16.3ක්ද ඇතුළු විවිධ ණය හිමියන්ගේ ශේෂයන්ය. වසර 5-10ත් අතර කාලයන්හි පවතින රු. මිලියන 5.9 ඉදිරි වසරවලට අදාලව ලැබී ඇති කුලී මුදල් වේ. වසර 10කට වඩා වැඩි කාලයක් නිරවුල්ව නොපවතින්නේ මාර්ග නඩත්තු කොන්ත්‍රාත්කරුවන්ගේ අත්හිටුවන ලද පොළී ගෙවීම් වේ. | පරිදි කපාහැරීම් සහ වෙන්කිරීම් සිදුකර ඇති බවට බවට අතිරේඛ අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) විසින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමට පෙර සහතික විය යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය | රජයේ නිවාඩු දිනයක වැඩ කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයෙන් ආවරණය නොවන කරුණු ආයතන අධ්‍යක්ෂකගෙන් විමසිය යුතු වුවත්, එසේ නොමැතිව, කාර්යාල සේවය සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් ද සේවා අවශ්‍යතාවය මත කාර්යාල වේලාවෙන් පසුව සේවයේ යෙදුණු පැය ගණනේ එකතුව ගණනය කර පැය 08 ක කාලයක් සඳහා එක් නිවාඩු දිනයක් ලෙස සලකා නිවාඩු දින ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව, අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයට අනුයුක්තව සේවය කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් සඳහා 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 13.18 ක | 2012.02.01 දින අධිකාරියේ පරිපාලන නියෝග අංක 01 මගින් මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් විසින් පැය 08 ඉක්මවා වැඩ කරනු ලබන පැය ගණන එකතු කර පැය 08 කට එක් නිවාඩු දින ගෙවීමක් බැගින් ගණනය කර මසකට උපරිම වශයෙන් දින 15 ක් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත. | නීත්‍යානුකූල නොවන ගෙවීම් අයකර ගත යුතුය. වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි. | | |
| (ආ) | 1995 ජුලි 21 දින ජනාධිපති ලේකම් කාර්යාලය නිකුත්කළ රජයේ ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 සහ 08 වගන්තිය | ගිවිසුමේ කොන්දේසි ලෙස අවුරුදු 05 කට වරක් බදුකුලී ප්‍රතිශෝධනය කළ යුතු වුවත් ඊට පටහැනිව, දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැලිපැන්න සේවා පෙදෙසෙහි ආපන ශාලා සහ ඉන්ධන පිරවුම්හල් පවත්වා ගෙන යාම සඳහා ඉඩම් කැබලි 04 ක් වසර 30 ක් හා වසර 99 ක කාලයක් සඳහා බදු පදනම මත පුද්ගලික සමාගම් 02 ක් වෙත වාර්ෂික බදු කුලිය රු.10,000 බැගින් වන ගිවිසුම් 03 ක් මඟින් 2013 සහ 2014 වර්ෂයේ දී බදු දී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද වාර්ෂික නාමික බදු කුලිය වන රු.10,000ක තක්සේරු මුදල මත කැබලි අංක 1 හා 9 සඳහා වසර 30කටද කැබලි අංක 4 හා 6 සඳහා වසර 99 වශයෙන් බදු දී ඇති අතර ඒ සඳහා ඔවුන්ගෙන් එකවර අදාල මුදල් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රිසෝට් ස්පාස් (පුද්) සමාගමෙන් රු.21,800,000 මුදලක් 2013.02.13 දිනද කැනෝවින් හොටෙල් ඇන්ඩ් ස්පාස් (පුද්) සමාගම වෙතින් රු.2,924,905 ක මුදලක් 2014.01.29 දිනද ලබාගෙන ඇත. | ඉඩම් පැවරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් කඩකළ නිලධාරීන් හඳුනාගෙන ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව හා XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, විනයානුකූලව කටයුතුකළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ | | | |
| (i) | 2006 සැප්තැම්බර් 22 දිනැති චක්‍රලේඛ අංක 30 හි ඇමුණුම II ඡේද අංක 04 | දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර තිබූ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක නොකර අධිකාරිය විසින් බඳවා ගෙන තිබුණු නිලධාරීන් 114 දෙනෙකු වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු MM 1-3 වැටුප් පරිමාණයේ මූලික වැටුප් වටිනාකම වෙනුවට HM වැටුප් | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මෙම වැටුප් පරිමාණයට අදාල අනුමැතිය තවමත් ලබා දී නොමැති අතර ඉදිරිපත්කළ කැබිනට් පත්‍රිකාව මගින් හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මගින් මෙම වැටුප් කේතයේ වැටුප් ලබාගන්නා නිලධාරීන්හට අභ්‍යන්තර වශයෙන් හිමිවීමට නියමිත උසස්වීම් ලබාගැනීමේදී මෙම ගැටළුව නිරායාසයෙන් විසඳේ. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා අනුමැතියකින් තොරව ඉහළ වැටුප් පරිමාණයක පිහිට වීමට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතුකළ යුතුය. අදාළ පත්කිරීම් අනුමත කළ, වැටුප් ගෙවීම් අනුමත කළ නිලධාරීන් මගින් අතිරික්ත ගෙවීම් අයකරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පරිමාවේ පිහිටුවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 437.89 ක අමතර මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | | |
| (ii) | 2006 අගෝස්තු 01 දිනැති චක්‍රලේඛ අංක 28 (II) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක ප්‍රමාණය ඉක්මවා බඳවා ගන්නා ලද නිලධාරීන් 857 ක් සඳහා 2023 වර්ෂයේ දී අධිකාරිය විසින් රු.මි. 309.7 ක මුදලක් වැටුප් ලෙස ගෙවා කර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත අවස්ථානෝචිතව සිදු කරන ලද බඳවා ගැනීම් හේතුවෙන් සමාලෝචිත 2023 වර්ෂය අවසන් වන දිනට (2023-12-31 දිනට) 856 ක අතිරික්ත කාර්යය මණ්ඩලයක් පැවතිය. | අදාළ පත්කිරීම් අනුමත කළ, වැටුප් ගෙවීම් අනුමත කළ නිලධාරීන් මගින් අතිරික්ත ගෙවීම් අයකරගත යුතුය. |
| (iii) | 2009 මැයි 26 දිනැති චක්‍රලේඛ අංක 39 | නිලධාරීන් හට අනුමත වූ වැටුපකට අමතරව යම් දීමනාවක් ලබා දෙන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතු වුව ද, ඊට පටහැනිව 2016 මාර්තු 28 දිනැති අංක 1698/2016 දරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් පදනම්ව අධිකාරියේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් හා අධිකාරී දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වසරේ දී සේවකයන් 382 දෙනෙකු සඳහා රු.මිලියන 110.59 ක් ඇතුළුව, 2016 සිට 2023 දක්වා රු.මිලියන 736.46 ක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණු අතර සමාලෝචිත වසරේ දී සේවකයන් 6,794 දෙනෙකු සඳහා රු.මිලියන 1,042.61 ක් ඇතුළුව, | එක් එක් වෘත්තියට අදාලව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය දරන විධායක නිලධාරීන් හට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් වෘත්තීය දීමනාවක් ගෙවනු ලබයි. මාර්ග සංවර්ධන අධිකාරි දීමනාව සාමූහික ගිවිසුමට එළඹීමේදී මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද දීමනාවක් වන අතර ඉන් ඉවත්වීමේදී අදාල වරප්‍රසාද එලෙසම පවතින බවට භාණ්ඩාගාර ලේකම් එකඟ වූ බව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෘතීය සමිති වෙත දැනුම් දී තිබුණි. | අනුමත නොකළ දීමනා ගෙවීම් අනුමත කළ නිලධාරීන් මගින් අතිරික්ත ගෙවීම් අයකරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2019 සිට 2023 දක්වා රු.මිලියන 5,232.61 ක් “මාර්ග සංවර්ධන අධිකාරි දීමනා” ලෙස ගෙවා තිබුණි. | | |
| (ඇ) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයය | | | |
| (i) | 8.9.3 වගන්තිය. | රු.මිලියන 100 සිට රු.මිලියන 500 දක්වා කොන්ත්‍රාත් රේඛීය අමාත්‍යාංශය ලේකම් හෝ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයකු විසින් බලය පවරා දී ඇත්නම් අතිරේක ලේකම්වරයා විසින් අත්සන් කළ යුතු වුව ද, එයට පටහැනිව මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් ගිවිසුම් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන්කර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබා ගන්නා ලද අනුමැතියට යටත්ව, කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 250 ක් දක්වා ගිවිසුම් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් ද කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 50 දක්වා කොන්ත්‍රාත් ගිවිසුම් පළාත් භාර අධ්‍යක්ෂවරුන් විසින් ද අත්සන් කර ඇත. | අනුමැතියකින් තොරව ගිවිසුම් අත්සන්කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |
| (ii) | 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ)(i) වගන්තිය | අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැරහැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි. | පසුගිය කාලපරිච්ඡේදයේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම ක්‍රියාත්මක වුවද වර්තමානයේදී එය පසුබෑමකට ලක්ව ඇත. එම නිසා ඉදිරියේදී වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. |
| (ඉ) | 2023 මැයි 16 දිනැති අංක අමප/23/0738/607/051 දරණ අමාතය මණ්ඩල තීරණය. | දැනට ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති මාර්ග අදාල ආයතන වෙත පවරා දීමට අධිකාරීය කටයුතු කළ යුතු වුවත් එවැනි වැඩ පිළිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග සියල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති නිසා අදාල ආයතන වෙත පවරාදීම ඉදිරියේදී සිදු කරනු ලැබේ. | අධිකාරියේ විෂයට අයත් නොවන මාර්ග ඉදිකිරීම නතර කිරීමටත් දැනට ඉදිකර ඇති මාර්ග පිරිවැය අදාළ පාළාත් පාලන ආයතන වෙත විධිමත්ව පැවරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2023 පෙබරවාරි 06 දිනැති අංක 23/0256/604/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා වූ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ (PERC) සාමාන්‍ය නිර්දේශ අංක 13 | අධිකාරිය යටතේ සියළු වර්ගවල සංචලනය සම්බන්ධ දත්ත ඇතුළත් ඒකාබද්ධ මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කර සංවර්ධන අරමුණු සඳහා අවශ්‍ය දත්ත සංචලනය සම්බන්ධ ඕනෑම රාජ්‍ය ආයතනයකට ප්‍රවේශ වීමේ හැකියාව සැපයිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අධිකාරිය යටතේ සියළු මාර්ගවල සංචලනය සම්බන්ධ දත්ත ඇතුළත් ඒකාබද්ධ මධ්‍යම දත්ත ගබඩාවක් ස්ථාපිත කළ යුතුය. |
| (උ) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත. | | | |
| (i) | 6(1) වගන්තිය | උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස්කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින් යොමු කරනු ලබන මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා පිහිටවිය යුතු "මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව" පිහිටුවා තිබුණද, කිසිදු රැස්වීමක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි. | දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන් ලෙස අදාල පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා පළාත් සභා නියෝජනය වන පරිදි මහජන නියෝජිතයින් නම් කළ යුතු බැවින්, එම ආයතන සඳහා සුදුසු මහජන නියෝජිතයින් තෝරා පත් කර ගැනීමෙන් අනතුරුව මෙහි සඳහන් දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටු පිහිටුවීමට පියවර ගැනීමට නියමිතය. | උපදේශක සභා පිහිටුවීමකින් තොරව පනතේ 6(2) වගන්තිය යටතේ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ලබාදෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 7(3) වගන්තිය | දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු මගින් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කලයුතු වුවත් ඒ අනුව කටයුතු නොකර රාජ්‍ය වියදම් | ජාතික මාර්ග පද්ධතියේ ඉදිරි වසර 10ක කාලය තුල ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කල යුතු මාර්ග කොටස් විද්‍යානුකූල පදනමක් මත හඳුනාගෙන ඇත. ඒ අනුව නඩත්තු/ ප්‍රතිසංස්කරණය කල යුතු ඉහළ ප්‍රමුඛතාවයන් සහිත ජාතික මහාමාර්ග තෝරාගෙන පස් අවුරුදු (2023-2027) නඩත්තු සැලසුම සකස් කර ඇත. | දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු පිහිටුවීමකින් තොරව පනතේ 7(3) වගන්තිය යටතේ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ලබාදෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සමාලෝචන කමිටුව වෙත අධිකාරියේ විසින් ඇස්තමේන්තු පිරිවැය රු.බිලියන 186.51 ක්වූ පස් අවුරුදු (2023 – 2027) නඩත්තු සැලසුමක් පමණක් ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව නඩත්තු කටයුතු සඳහා මාර්ග තෝරාගැනීම නියමිත පරිදි සිදුකර නොතිබුණි. | | |
| (ඌ) | 2005 නොවැම්බර් 03 දිනැති අංක: අමප/05/1711/016/110 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබූ මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ආදායම් බලපත්‍ර ගාස්තු සමග බද්දක් අය කිරීම සඳහා සකස් කරන ලද දළ කෙටුම්පත් පනත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය ප්‍රතිපත්ති නිශ්චිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමස්ත මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 67,846.10 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 42,903.61 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 24942.49 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අධිවේගී මාර්ග වලින් ලද ශුද්ධ ආදායම පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 3,070.11 කින් වැඩිවීම සහ පොලී ආදායම රු.මිලියන 726.94 කින් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 342,070.13 ක් වූ අතර එය රු.මිලියන 250,904.47 ක බැංකු ණය වලින් හා රු.මිලියන 91,165.66 ක ණයකර වලින් සමන්විත විය. මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, අධිවේගී මාර්ග ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොළිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට උපරිම වශයෙන් සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට පොළිය නියම කොට තිබුණි. මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | අනුරූපී වසරට සාපේක්ෂව වෙනස් වීමේ ප්‍රතිශතය | පෙර වසරට සාපේක්ෂව වෙනස්වීමේ ප්‍රවනතාවය |
|---|---|---|
| පුනරාවර්ථන ප්‍රදාන | 07 | වැඩිවීමකි |
| ප්‍රාග්ධන ප්‍රදාන | 58 | වැඩිවීමකි |
| අධිවේගී මාර්ග ශුද්ධ ආදායම් | 470 | වැඩිවීමකි |
| සංවර්ධන හා නඩත්තු වියදම් | 18 | අඩුවීමකි |

නඩත්තු හා වැඩිදියුණු කිරීම් සඳහා රේඛීය හා රාජ්‍ය අමාත්‍යාංශ හරහා ලද ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 9,126.51 කින් අඩුවීම සංවර්ධන හා නඩත්තු වියදම් සියයට 18 කින් පහළ යාමට හේතු වී තිබූ අතර අධිවේගී මාර්ග ඉදිකිරීම වෙනුවෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 32,311.32 කින් වැඩිවීම ප්‍රාග්ධන ප්‍රදාන සියයට 58 කින් වැඩිවීම කෙරෙහි හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අධිභාර බදු රු. මිලියන 1,341.53 කින් පහළයාම හේතුවෙන් අධිවේගී මාර්ග ශුද්ධ ආදායම සියයට 470 කින් ඉහල යාමට හේතු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2023 දෙසැම්බර් 31 දිනට | 2022 දෙසැම්බර් 31 දිනට | පෙර වසරට සාපේක්ෂව වෙනස් වීම යහපත් ද අයහපත් ද යන වග |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 0.92 | 1. 1 | අයහපත් පහල යාමකි |
| ක්ෂණික අනුපාතය | 0.90 | 1.09 | අයහපත් පහල යාමකි |
| ශුද්ධ ලාභ අනුපාතය | 31.28 | 4 | යහපත් ඉහල යාමකි |
| ණය ස්කන්ධ අනුපාතය | 37.78 | 0.45 | යහපත් ඉහල යාමකි |
| මුළු ණය- මුළු වත්කම් අනුපාතය (සියයට) | 25.7 | 36 | යහපත් ඉහළ යාමකි |

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිගත් අවම මට්ටමේ පැවති අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එකී අනුපාතයන් වල ඍණාත්මක අඩුවීමක්ද නිරූපනය විය. ලැබිය යුතු වැඩ පූර්ව අත්තිකාරම් (Mobilization Advance) රු.මිලියන 9,957.01 කින් අඩු වීම හා කොන්ත්‍රාත් කරුවන්ට ගෙවිය යුතු ශේෂය රු.මිලියන 4,491.34 කින් වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වි තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය පෙර වසර සමග සැසඳීමේ දී සියයට 27.28 ක වැඩිවීමක් නිරූපනය වන අතර ඒ සඳහා අධිවේගී මාර්ග වලින් ලද ආදායම රු. මිලියන 3,070.11 කින් වැඩිවීම. පොලී ආදායම රු.මිලියන 726.94 කින් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ සිට 2024 ජනවාරි 31 දින දක්වා කාලය අවසන් වන විට අධිකාරිය තුල රු.මි.2.08 ක් ඉක්මවූ මුදල් වංචා සිදුකර ඇති බව නියැදි | මුදල් ගෙවන අවස්ථාවේ ලබා දෙන රිසිට් පත් සංසන්දනය කර ගැනීම සඳහා දත්ත පද්ධතියක් සමස්ථ අධිවේගී මාර්ග ජාලය | ඵලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විගණන මගින් අනාවරණය වී තිබුණි. මෙවැනි මුදල් වංචා වළක්වා ගැනීම සඳහා රිසිට් පත් ආදායම් පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන අතර දැනට භාවිතා කරන අයකැමි පද්ධතිය 2011 වර්ෂයේ තාවකාලිකව ස්ථාපිත කරන ලද පද්ධතියක් විය. | වෙතම නොමැත. | |
| (ආ) | කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සඳහා 2014 දෙසැම්බර් 18 දින අධිකාරිය හා ලංකා බැංකුව සමඟ එළඹි ගිවිසුමේ ගිවිසුම් ගත කාලය 2020 ජුනි 08 දිනෙන් අවසන් වී වසර 04 ක් ඉක්මවා ගොස් ඇතත් නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ගිවිසුම්ගත වීමකින් තොරව 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන්වන විට ගනුදෙනු පිරිවැය ලෙස එකතුව රු.මි.28.35 ක් අධිවේගී මාර්ග ආදායමෙන් අඩු කිරීම විගණනයේ දී ප්‍රශ්නකාරී විය. | නව ගිවිසුම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ගිවිසුම 2024/05/16 දින අත්සන් කර ඇත. | මු.රෙ 137 අනුව විධිමත් ගිවිසුමක් නොමැතිව ගෙවීම් අනුමත කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය. |
| (ඇ) | අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමය භාවිතා කරන්නන් දිරිමත් කිරීමට අයකරන ගාස්තු වලින් සියයට 10 ක වට්ටමක් ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමයට මාරු වන මුල් මාස 06 ක කාලයක් දක්වා එම භාවිතකරුවන්ට ලබා දීමට අවසර ලබා දී තිබුණි. නමුත්, ඉන් පසුවත් එම වට්ටම සියයට 10 සීමාව යටතේම ක්‍රියාත්මක වීම හේතුවෙන් 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු. මිලියන 137.74 ක් අධිකාරියට අහිමි වී තිබුණි. | 2023 ඔක්තෝම්බර් 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ETC භාවිතා කරන්නන් සඳහා ලබා දෙන 10% වට්ටම අවලංගු කිරීමේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී නොමැත. | මු.රෙ 137 අනුව විධිමත් ගිවිසුමක් නොමැතිව ආදායම් අයනොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |
| (ඈ) | මුලා ප්‍රකාශන අනුව දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් රු.මිලියන 767,630 ක පමණ වටිනාකමකින් යුතු අධිවේගී මාර්ග කි.මී. 312.6 ක් ඉදිකර ඇති බව සඳහන් විය. මෙම මාර්ගයන් හි සියලුම පරිපාලන කටයුතු අධිකාරිය වෙත පවරා තිබුණු අතර, පොලිසියට පහසුකම් සැපයීම ඇතුළුව මෙහෙයුම් | තිබෙන පහසුකම් අනුව ප්‍රමාණාත්මකව මේ වනවිට වැඩි කර ඇතත් අධිවේගී මාර්ගයන්හි දේපළ මාර්ගය දිගේ විසිරී පවතින බැවින් එම දේපළ සඳහා සම්පූර්ණ ආරක්ෂාවක් ලබා දීම ඉතා අපහසු කාර්යයක් වී ඇත. | ආරක්ෂිත වැඩ පිළිවෙලක් සඳහා ඵලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු සඳහා රු.මිලියන 2,000 කට වැඩි පිරිවැයක් දරමින් පැවතිය දී අධිවේගී මාර්ගයේ ඇති වත්කම් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක වැඩපිළිවෙළක් සකස් නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට අධිවේගී මාර්ගයන්හි දේපළ සොරකම් කිරීම හා හානි වීම් වාර්තා වී ඇති අතර, එම හානි වීම්වල වටිනාකම රු. මිලියන 913.17 ක් පමණ වී තිබුණි. | | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන ඉඩම්, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාර නිදහස් ප්‍රදානයක් වශයෙන් අධිකාරිය වෙත වෙන්කරදීම සඳහා 2014 ඔක්තෝබර් 30 දින අමාත්‍යමණ්ඩලය තීරණය කර තිබුණද, අධිකාරිය විසින් භුක්ති විඳින අක්කර 935.855 ක ඉඩම් එකී තීරණය පරිදි අධිකාරිය වෙත පවරාගෙන ගිණුම්ගතකිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතුකර නොතිබුණි. | මේ වන විටත් නිදහස් දීමනා පත්‍ර යටතේ ඉඩම් කැබලි 356ක් සඳහා ඉල්ලුම්පත්‍ර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත භාර දී ඇති නමුත් මෙතෙක් නිදහස් දීමනා පත්‍ර අධිකාරිය වෙත ප්‍රදානය කර නොමැත. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සමග මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය. | අමාත්‍ය මණ්ඩලය තීරණය ක්‍රියාත්මක කිරීමට අදාළ වගකීම් නිෂ්චිතව පවරා දී අවශ්‍ය පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියට අයත් වටිනාකම රු. මිලියන 292.55 ක් වූ වාහන 26 ක් බාහිර ආයතන හා අමාත්‍යාංශ වෙත පවරා තිබුණි. එහෙත් අදාළ වාහන බාරදුන් දිනයන් හා බාරගනු ලැබූ බවට වන ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. එසේ තිබියදී, අධිකාරියේ රාජකාරි කටයුතු සඳහා කුලී පදනම මත වාහන ලබාගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව අධිවේගී මාර්ගයේ පරිපාලන කටයුතු සඳහා පමණක් රු.මිලියන 252.86 ක් වැයකර කුලී පදනම මත වාහන ලබාගෙන තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන අදාල අනුමැතීන් මත පමණක් රේඛීය අමාත්‍යාංශය හා අගමැති කාර්යාලය ඇතුළු බාහිර ආයතන වෙත නිදහස් කර ඇත. සේවා අවශ්‍යතාවය මත පමණක් අධිවේගී මාර්ග අංශය මගින් කුලී පදනම මත වාහන ලබාගෙන ඇති අතර එම අංශයේ සියලුම වාහන අවශ්‍යතාවය සපුරාලීමට තරම් ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නොමැත. | බාහිර ආයතන හා අමාත්‍යාංශ වෙත අවිධිමත් ලෙස වාහන පවරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර කුලී වාහන භාවිතය අවම කළ යුතුය. |
| (ඇ) | වටිනාකම රු.මිලියන 347.37 ක් වූ Aggregate Chip Spreaders යන්ත්‍ර 11 ක් 2010 වර්ෂයේ දී අධිකාරිය වෙත ජනාධිපති කාර්යසාධන බලකාය විසින් | මෙම යන්ත්‍රයන් ආයතනයේ අවශ්‍යතාවය පිළිබඳව විධිමත් අධ්‍යයනයක් සිදු නොකර ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් මිලදී | ප්‍රයෝජනයට ගතනොහැකි මෙම යන්ත්‍ර බාරගෙන ප්‍රයෝජනයට නොගෙන තබාගත් |

| | | | |
|---|---|---|---|
| | ආනයනය කර ලබා දී තිබුණු අතර, අදාළ යන්ත්‍රවල පළල මීටර් 4.2 ක් වීම හේතුවෙන් හා එම පළල සාමාන්‍ය පාරක පළලට වඩා වැඩි වීම හේතුවෙන් එම යන්ත්‍ර අධිකාරිය වෙත පැවරුනු දින සිට භාවිතා කර නොතිබුණු අතර, එම යන්ත්‍රවල වටිනාකම වර්ෂ 14 කට පසු රු.මිලියන 4.4 කට තක්සේරු කර අපහරණය කිරීමට 2024 වර්ෂයේ දී තීරණය කර තිබුණි. ඒ අනුව අදාළ යන්ත්‍ර අධිකාරියේ අවශ්‍යතාවලට නොගැලපෙන බව දැන දැනම ප්‍රයෝජනයට නොගෙන තබා ගැනීම විගණනයේදී මතභේදාත්මක විය. | ගෙන ලබා දී තිබූ ඒවා වන අතර දිවයින පුරා පවතින මාර්ග්වල ධාවනයට මෙම යන්ත්‍ර භාවිතා කිරීමට නොහැකි විය. මාර්ග සංවර්ධන අධිකාරිය නඩත්තු කරන A හා B ශ්‍රේණියේ මාර්ගයන්හි මේ වන විට ගල්තාර ඇතිරීම සිදු නොකරන බැවින් මේවා අධිකාරියට භාර දුන් දින සිටම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |
| (ඇ) | පරිපාලිත සමාගම්. | | |
| (i) | අධිකාරියට අයත් සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2017 වර්ෂයේ සිට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණන මතය ව්‍යාචනය කර තිබුණි. | සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2016-2019 දක්වා පිළියෙල කර ඇති අතර මගනැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2022 දක්වා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන කාලීනව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය අනුව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් සියළු සමාගම් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පරිපාලිත සමාගම්වල කොටස් අයිතිය සම්බන්ධයෙන් වූ ගැටළු හේතුවෙන් හා නිසිකලට ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම නිසා වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා නොතිබුණි. මේ වන විට මෙම සමාගම් සියල්ල ඈවරකරණ ක්‍රියාවලියේ පවතී. | සමාගම් පනත අනුව සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය. |
| (iii) | 1981 අංක73 දරන මාර්ග සංවර්ධන අධිකාරි පනත යටතේ "මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ බස් සමාගමක් පවත්වා ගෙන යාම අදාළ විෂය කරුණක් නොවූව ද, බස්රථ යෙදවීම මඟින් අධිවේගී මාර්ගවල මගී ප්‍රවාහනය පිළිබඳ ව්‍යාපෘති කටයුතු සිදු කිරීම සඳහා සියයට 100 ක් ම අධිකාරිය සතු සමාගමක් වශයෙන් 2014 වර්ෂයේදී සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්) සමාගම සංස්ථාපනය කර තිබුණි. නමුත්, මෙම සමාගමේ අසාර්ථක වීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 216 ක් | විගණන ඡේදය හා එකඟ වේ. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, විනයානුකූලව කටයුතුකළ යුතුය. |

වූ බස්රථ 20 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පවරා දී සමාගම අවසන් කිරීමට 2023 මාර්තු 23 දිනැති අංක 23/0394/608/033 අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලයට අයත් ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත් 02 ක් සඳහා එකම අංකය දරන වාහනයක් එකම කාල පරාසයක් තුළ ධාවනය කළ බව සඳහන් කරමින් එකතුව රු.මි. 5.29 ක බිල්පත් ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව අදාළ බිල්පත් ව්‍යාජ ඒවා බව නිරීක්ෂණය වන අතර, එම බිල්පත් වටිනාකම සහතික කල, අනුමතකල නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි 156(1), 103(1)(අ) සහ 105 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | වවුචර්පත් සඳහා ගෙවීම් සිදු කිරීම අත්හිටුවා ඇති අතර ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වැළැක්වීම සහ ප්‍රසම්පාදන ක්‍රමවේදය විනිවිදභාවයකින් යුතුව සිදු කරන ලෙස හා මුදල් රෙගුලාසි අනුව අදාල නිලධාරීන් වගකීමට යටත් බව සඳහන් කරමින් උපදෙස් ලබා දී ඇත. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් XLVIII වන පරිච්ඡේදයේ 29 වන වගන්තිය අනුව, විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගම්පොල පැරණි පාලම අසල භාවිතයට නොගන්නා මාර්ග කොටස් 2017 වර්ෂයේ සිට දී.මු. ජයරත්න ආගමික ජෛව විවිධත්ව සංකීර්ණයේ ප්‍රචාරක මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා සමාගමක් වෙත අධිකාරිය විසින් පවරා දී ඇති අතර මෙම ඉඩම සඳහා වාර්ෂික කුලී බදු අයකර ගෙන නොතිබුණි | ගම්පොල පැරණි පාලම අසල භාවිතයට නොගන්නා මාර්ග කොටසේ භූමි ප්‍රමාණය වර්ග මීටර් 819ක් වන අතර කුලී ගාස්තු අය කිරීමකින් තොරව 2017 වසරේදී එම සමාගම වෙත මෙම කොටස පවරා ඇති අතර මෙම ඉඩම් කොටස සඳහා වාර්ෂික බදු මුදල් අය කරගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | විමර්ශණයක් සිදුකර අදාළ භූමිය පවරාදීමේදී විධිමත් පරිපාටීන් අනුගමනය කර නිසි අනුමැතියක් සහිතව සිදුකර තිබේද යන්න තහවුරුකර ගත යුතුය. ඒ අනුව වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015, 2017 සහ 2020 යන වර්ෂයන් හි දී ව්‍යාපෘති කටයුතු අවසන් කර අධිකාරිය වෙත බාර දුන් ව්‍යාපෘති 06 ක් මගින් අත්කරගත් සමස්ථ ඉඩම් කැබලි 21,757 ක ප්‍රමාණයෙන් ඉඩම් කැබලි15,019 කට අදාලව වන්දි හා පොලී ලෙස රු.මි. 196.24 ක් ගෙවා තිබුනු අතර ඉඩම් කැබලි 982 කට අදාල වන්දි හා පොලී සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවා අවසන් | ව්‍යාපාති වලට අදාලව ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී අදාල ප්‍රාදේශීය ලේකම් වන අතර එම ඉඩම් අධිකාරිය වෙත පැවරීම සිදු කරනුයේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුවය. එකී ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ ක්‍රමවේදය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව 2024 වසර මාර්ග ව්‍යාපෘතිවලට අදාල | ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කාලීනව සිදුකර අමතර වියදම් අවම කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ රජයේ ඉඩම් කැබලි 5,756 කට අදාල වන්දි නොගෙවීමට අධිකාරිය තීරණයකර තිබුණි. තවද,ඉඩම් අත්පත් පනතේ විධිවිධාන අනුව අත්කරගත් සමස්ථ ඉඩම් කැබලි 21,757 ක ප්‍රමාණයෙන් කිසිදු ඉඩම් කැබැල්ලකට අදාලව ඉඩම් අත්පත් පනතේ 44 වගන්තිය යටතේ වන සහතිකය ලබාගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචිය කඩිනම් කිරීමේ වසර ලෙස සලකන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. | |
| (ඈ) | දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව සිට කොට්ටාව දක්වා මාර්ගය මෘදු බිම් ප්‍රදේශ (Soft Ground Areas) හරහා දිවෙන බැවින් වර්ෂ 07 ක කාලයෙන් පසු Asphalt Overlaying කිරීම සිදු කළ යුතු බව හඳුනා ගෙන තිබුණ ද, විගණිත දිනය වූ 2024 පෙබරවාරි 09 දින වන විටත් එම කාර්යය සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි. | වසර 12 ක් ගතවීමත් සමඟ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට දොඩංගොඩ දක්වා පිටත මං තීරු දෙකෙහි බොහෝ කඩතොළු ඇති බැවින් පෙරමුඹු ඇතිරීමේ අවශ්‍යතාවයක් ඇති වී ඇත. | තාක්ෂණ පිරිවිතර ප්‍රකාරව නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා අයවැය සකස් කිරීමේදී අදාල ප්‍රතිපාදන වෙන්කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවිය යුතු රු. මිලියන 6,969.46 ක් හා එම සමාගම විසින් අධිකාරිය වෙත අය විය යුතු රු.මිලියන 1,240.34 ක් පැවතියද, ඊට අදාළ ශේෂ තහවුරුකිරීමේ ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | මගනැගුම මාර්ග ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සමාගම වෙතින් අයවිය යුතු ශුද්ධ මුදල තහවුරු කර ගැනීම සඳහා අදාල ලිපි අධිකාරිය විසින් අදාල සමාගම වෙත 2024.05.14 දින යවා ඇත.. | ශේෂ තහවුරුකිරීමේ ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත් කටයුතු ඉටු කිරීම සඳහා සේවාදායකයන්ගේ ලබාගත් තැන්පතු ශේෂය (Client Deposit) රු.මිලියන 3,119.15 ක් වූ අතර ඉන් වර්ෂ 05 ඉක්ම වූ ඉටු නොකරන ලද කොන්ත්‍රාත් 150 කට අදාළ ශේෂය රු.මිලියන 883.98 ක් වූ අතර වර්ෂ 3-5 ක් අතර ඉටු නොකරන ලද කොන්ත්‍රාත් 449 කට අදාළ ශේෂය රු.මිලියන 1436.65 ක් විය. පළාත් කාර්යාල සමඟ කොන්ත්‍රාත් | රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හා ආර්ථික අර්බුදකාරීතාවය මෙන්ම වෙළඳපළ අමුද්‍රව්‍ය හිඟයද මේ සඳහා සෘජුව බලපා තිබුණි.<br>නමුත් මේ වන විට වැඩ අවසන් කර නොමැති සේවාදායක කාර්යයන් ඉක්මනින් අවසන් කරන ලෙසට හා වැඩ අවසන් වූ ව්‍යාපෘතිවලට අදාලව ආදායම් හඳුනාගැනීමේ කටයුතු කඩිනම් | මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු නියමිත කාලයේදී ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධ තොරතුරු හුවමාරුව ප්‍රමාදවීම සහ පසුවිපරම් කටයුතුවල පවතින දුර්වලතා මෙම තත්ත්වයට බලපා තිබුණි. | කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) | ප්‍රසම්පාදනයේ ස්භාවය අනුව, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට කොන්ත්‍රාත් ඇස්තමේන්තු පිළියෙල නොකර පිළිවෙලින් කි.මී. 50 සහ කි.මී. 100 සීමාවට අදාළ රු.මිලියන 6.33 ක් සහ රු.මි.12.66 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තු 02 පිළියෙල කර සියළු දිස්ත්‍රික්කවල ප්‍රසම්පාදන ඇගයීම් සඳහා යොදා ගෙන තිබුණු අතර, අදාළ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා HSR රේටයන් ද සකස් කර නොතිබුණි. | උක්ත ව්‍යාපෘතියට අදාලව අවශ්‍ය මැනුම් කටයුතු සඳහා මිල ගණන් කැඳවනු ලැබූ අයිතම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමට අදාල තොරතුරු HSR තුල නොමැති අතර දල අවබෝධයක් ලබා ගැනීම සඳහා ලබා තිබූ අත්දැකීම් මත පදනම්ව දිස්ත්‍රික්ක සියල්ලම සඳහා එක් ඉංජිනේරු ඇස්තමේන්තුවක් කි.මී. 50 සහ කි.මී. 100 සඳහා පිළියෙල කර ඇත. | ඇස්තමේන්තු සකස්කිරීමට පාදක කරගනුලබන රේටයන් අනුමත පරිපාටියට අනුව සකස්කිරීමට හා එසේ කටයුතුකර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |
| (ඇ) | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 01 හා 03 කොටස් සඳහා රු.මිලියන 36,529.63 ක්ද, රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා රු.මි.3250 ක්ද ඇතුළත්ව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගිණුම්ගතකර ඇති රු.මිලියන 41,962 ක මුදලින් 2023 දෙසැම්බර් 31 දින දක්වා අය නොවී පවතින රු.මිලියන 41,831.56 ක් ඉදිකිරීම් වැඩ අවසන් කර බිල්පත්‍ර වලින් අඩු කළ යුතු අතර, එසේ නොවන්නේ නම් අධිකාරිය වෙත ලැබිය යුතු මුදල් ආපසු අයකර ගැනීමට ක්‍රියා කළ යුතු බව විගණනයේ දී නිරීක්ෂණය වන අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (Supplement) 29 ට අනුව ලබාගත් අත්තිකාරම් සුරක්ෂණයන් අලුත් කිරීමට කටයුතු කර නොමැති වීම හේතුවෙන් මෙම මුදල් ආපසු අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි. | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා වන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් එම ව්‍යාපෘතියේ අවසාන බිල්පත මගින් නිරවුල් කර ගැනීමට නියමිත අතර එම බිල්පත පියවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම වසර තුල මෙතෙක් නොමැති වීම හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකිව පවතී.<br>මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති 1 හා 3 සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලින් රු. මිලියන 1359.86 අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල් මෙම වසර තුලදී අය කර ගැනීමට බලාපොරොත්තු වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත විය යුතුය. වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගත යුතුය. |
| (ඈ) | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය සඳහා තෝරා ගෙන පසුව අතරමග නතර කරන ලද මාර්ග ධාවන තත්ත්වයට පත් කිරීමට 2023 ජනවාරි 30 දිනැති අංක 23/0127/608/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණ ද, ඇස්තමේන්තු | බොහෝමයක් මාර්ග ගමනාගමනයට සුදුසු තත්ත්වයට පත් කිරීමට (Motorable Condition) තෝරා ගැනීමත් සමග සංවර්ධන කටයුතු අවසන් නොකළ මාර්ග ප්‍රමුඛතා පදනමින් සැලසුම් අනුව ප්‍රතිසංස්කරණ | අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටස 48 පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය |

| | | | |
|---|---|---|---|
| | පිරිවැය රු.මිලියන 2,891.24 ක් වූ නව මාර්ග කි.මී. 212.30 ක් ධාවන තත්ත්වයට පත්නොවූ මාර්ග යටතේ සංවර්ධනය කිරීමට තෝරා ගැනීම විගණනයේදී මතභේදාත්මක විය. | කටයුතු සඳහා තෝරා ගන්නා ලදී. | ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සකස් කරන ලද 2020 ජනවාරි 14 හා 2020 නොවැම්බර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.5 මාර්ගෝපදේශයට නිකුත් කරන ලද අතිරේක 39 ට අනුව කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය හැකි කොන්ත්‍රාත් වටිනාකම් සීමාවන් අවමය රු.මිලියන 75 සිට උපරිමය රු.මිලියන 300 දක්වා අසාමාන්‍ය පරාසයකින් ඉහළ දැමීමට ඉල්ලීම් ඉදිරිපත්කර තිබුණු අතර ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතීන්ද ලබාගෙන තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමිය යුතු CIDA ශ්‍රේණිය හා කොන්ත්‍රාත් ප්‍රදාන වටිනාකම වෙනස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත්කිරීමට පෙර CIDA ආයතනයේ එකඟතාවය ලබා ගැනීමට අමාත්‍යාංශය කටයුතුකර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාව සහ කොන්ත්‍රාත් වටිනාකම් සීමාවන් මෙම ව්‍යාපෘතිය සඳහා පමණක් වන පරිදි ඉහළ දැමීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතිය ලබා දෙන ලදී. | CIDA ශ්‍රේණිය හා කොන්ත්‍රාත් වටිනාකම සංශෝධනයට CIDA ආයතනයේ එකඟතාවය ලබාගත යුතුය. |
| (ඊ) | 2020 ජනවාරි 14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.5(ඉ) වගන්තියට අනුව මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ වන සියලු මාර්ග වැඩ කොන්ත්‍රාත් සඳහා ගෙවීම, Milestone ගෙවීම් මත පදනම්ව නිමැයුම් පදනම (Milestone Delivery Modle) මත සිදුකරනු ඇති බව සඳහන් කර තිබුණි. මෙම ගෙවීම් ක්‍රමය වැඩි තාක්ෂණික අවශ්‍යතා ඇති ව්‍යාපෘතින් (Turnkey) සඳහා යොදාගනු ලබන ක්‍රමවේදයක් වන අතර ඇස්තමේන්තු සකස්කල හැකි මාර්ග ඉදිකිරීම් සඳහා සාමාන්‍යයෙන් භාවිතා නොකරන ක්‍රමයකි. තවද, Standard Bidding Document Procurement of work Design and Build contracts (CIDA/SBD/04) හි 4.1 වගන්තියට අනුව, මෙම ක්‍රමය යටතේ වන කොන්ත්‍රාත්තුවක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කරීම හා | කි.මී. 100,000 ව්‍යාපෘතියද Lump Sum ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කිරීම තාක්ෂණික දැනුමක් සහිත කණ්ඩායමක් විසින් තීරණයකර ඇත. එකවර මුදල් ගෙවීමේ ක්‍රමවේදය (Lump Sum) හරහා මූල්‍ය පරිපාලනය වඩා පහසු වන අතර වැඩ බිමේදී නිරීක්ෂණය කරනු ලබන කාර්යයන්ට අදාළ වන සියලු වැඩි වීම් කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ යුතු වෙයි. තවද මෙම ව්‍යාපෘතිය මහා පරිමාණ ව්‍යාපෘතියක් වන බැවින් සියලු ව්‍යාපෘතින් මැනුම්කර ගෙවීම් සිදු කිරීමට විශාල කාලයක් අවශ්‍ය වේ. මෙම ක්‍රමවේදය අනුගමනය කරන ව්‍යාපෘතියන් තුළ පවතින අවධානම හා වගකීම කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතු වෙයි. ඉංජිනේරු ඇස්තමේන්තු | Standard Bidding Document Procurement of work Design and Build contracts (CIDA/SBD/04) හි වගන්ති අංක 4.1 අනුව කටයුතුකර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතුකළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) ඡේදය යටතේ වූ සමාලෝචනයේදී මෙම ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණ කිරීම කොන්ත්‍රාත්කරු විසින් සිදුකල යුතු වුවත් මෙම ව්‍යාපෘතිය සඳහා නිර්මාණය කිරීම (Design) අදාළ නොවන බව සඳහන් කර තිබුණි. ඒ අනුව මෙම ක්‍රමය සම්පූර්ණ වශයෙන් අනුගමනය කර නොතිබුණි. තවද, මෙම ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීම සිදුකළද, අතර මඟ නතර කර ඇති කොන්ත්‍රාත් සම්බන්ධයෙන් මුදල් ගෙවීම් තීරණය කිරීමේ දී නැවත මැනුම් කර ගෙවීම් කිරීමේ ක්‍රමවේදය (Measure and Pay) අනුගමනය කිරීමට සිදු වී තිබුණි. | වටිනාකම පමණක් කොන්ත්‍රාත්කරුවන් හට ලබා දී ඒ සඳහා තරඟකාරී වට්ටම් මුදලක් ලබා ගැනීම අනුගමනය කරන ලද ක්‍රමවේදය වේ. | පරිපාටීන් හඳුන්වා දී ලිඛිත උපදෙස් නිකුත්කළ යුතුය. |
| (උ) | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත් පැකේජයන්ට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව ලංසුකරුට ඉදිරිපත් කර ඒ සඳහා උපරිම වට්ටමක් ලබාදීමේ ක්‍රමය අනුගමනය කර තිබුණි. ඒ අනුව, තොරාගත් කොන්ත්‍රාත් පැකේජ 24 ක් සඳහා අදාළ ලංසුකරුවන් විසින් ලබා දී තිබූ වට්ටම් ප්‍රමාණය සියයට 0.19 සිට සියයට 13.56 දක්වා පරාසයක පැවතුණි. ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් පළාත් 09 මගින් ප්‍රධානයකරන ලද කොන්ත්‍රාත් වලට අදාල ඇස්තමේන්තු වටිනාකම 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 3,484 කින් පමණ අධි ඇස්තමේන්තු වී තිබුණි. ඒ අනුව, අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව ප්‍රසිද්ධ නොකර මිල කැඳවීම් හරහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සිදු කළේ නම් අස්ථිත්වයට වට්ටම් මගින් හිමිවන ප්‍රතිලාභයට වඩා වැඩි වාසිදායක තත්ත්වයක් ලබාගත හැකිව තිබුණු බව නිරීක්ෂණය කෙරේ. | රජයේ විගණන නිලධාරීන් ද සහභාගීත්වයෙන් පැවැත්වූ සාකච්ඡාවේදී ඇතිවූ එකඟතාවයන් අනුව ඇස්තමේන්තු නැවත විශ්ලේෂණය කරන ලෙස අදාල පළාත්භාර අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇත. කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේදී එක් එක් අයිතම සඳහා වටිනාකම් කොන්ත්‍රාත් සමාගම වෙත ලබා දීම සිදු නොවන බැවින් එම මාර්ගය ඉදිකිරීමට යන අවම පිරිවැය සම්පූර්ණ ඇස්තමේන්තු මුදල හා සසඳා බැලීමෙන් අනතුරුව එම ව්‍යාපෘතියට වට්ටම් මුදල් ලබා දීම සිදු කරයි. කොන්ත්‍රාත් ප්‍රධානය කර ගිවිසුම් ගත වී ඇති බැවින් එය වෙනස් කිරීම මගින් අමතර ගෙවීම් (Contractual Claim) සඳහා කොන්ත්‍රාත්කරුවෝ යොමු විය හැකි අතර එසේ වුවහොත් කොන්ත්‍රාත්කරුවන් හට ගෙවීමට සිදුවන මුදල ප්‍රමාණාත්මකව වැඩිවේ. | ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේ දී නිවැරදි නොවන ඉංජිනේරු ඇස්තමේන්තු මත කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ XLVIII පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය විසින් ලබාගත් සේවාවන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත අවස්ථා දෙකක දී වටිනාකම රු.මිලියන 40,651.55 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර නිදහස් කර තිබුණි. එම බැඳුම්කර නිදහස් කරන අවස්ථාව වන විට ව්‍යාපෘතිය විසින් බාහිර පාර්ශවයක් | පළාත් කාර්යාල වෙතින් යොමු කරන ලද බිල්පත් කිහිපයක් නැවත සංශෝධනය කරන ලද අතර ඒ අනුව අදාල වෙනසට අයවිය යුතු මුදල එම අවස්ථාවේදී අයකර ගැනීමට කටයුතු කරන ලදී. | බැරකම් නිවැරදිව ගණනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | වෙත ගෙවීමට ඇති වට්නාකම් (බැඳීම්) නිවැරදිව ගණනය කර නොතිබීම හේතුවෙන් අවස්ථා 11 දී කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙක් වෙත නිකුත් කර තිබුණු රු.මිලියන 121.17 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර වලට සමාන මුදලක් පසුව ව්‍යාපෘතිය වෙත අදාල කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවා තිබුණි. ඒ අනුව එම වට්නාකමට අදාළ භාණ්ඩාගාර බිල්පත් සඳහා රජය විසින් ගෙවනු ලබන පොලිය හා වට්ටම් කරන ලද මුහුණත වට්නාකම රජයට සිදු වන පාඩුවක් විය. | | කටයුතු කළ යුතුය. |
| (එ) | 2020 පෙබරවාරි 13 දිනැති අංක: අමප/20/0142/221/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2020 ජනවාරි 14 දිනැති අංක 2020/01 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.1 ඡේදයේ සඳහන් පරිදි මාර්ග කි.මී. 100000 ව්‍යාපෘතිය යටතේ මාර්ග තෝරා ගැනීමේ දී ලකුණු ලබා දිය යුතු පිළිවෙලට අනුව, ලකුණු 40 සීමාව ඉක්මවා ලබා ගන්නා මාර්ග පළමු අධියරේදී තෝරා ගැනීමට නිර්දේශ කර තිබුණු නමුත්, බස්නාහිර පළාත් ව්‍යාපෘති කාර්යාලය මඟින් රු.මිලියන 1,826 වැයකර ඉදිකරන ලද මාර්ග තෝරා ගැනීමේ දී එවැනි ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර ව්‍යාපෘති අරමුණෙන් බැහැරව පාසල් අභ්‍යන්තර මාර්ග සහ එළිමහන් ස්ථාන, උද්‍යාන භූමි, පල්ලි, පන්සල්, නිවාස සංකීර්ණ, පොලිස් ස්ථාන හා යුධ හමුදා කඳවුරු වලට අයත් පොදු ස්ථාන හා එම ආයතනය වලට අයත් අභ්‍යන්තර මාර්ග සංවර්ධන කටයුතු සිදු කර තිබුණි. | 100,000 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී ව්‍යාපෘතියේ මාර්ග තෝරා ගැනීමට ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක විය. ඒ අනුව ලකුණු ලබා දීමේ ක්‍රමවේදය මගින් ලකුණු 40 ඉක්මවා ඇති මාර්ග සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් එම ව්‍යාපෘතීන්ට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කළ අතර ලකුණු 40 ක ප්‍රමාණයට අඩු අත්‍යවශ්‍ය සහ ආර්ථික හා සාමාජීය වශයෙන් වැදගත් මාර්ග ඍජු කම්කරු ශ්‍රමය යටතේ සංවර්ධන කිරීම සිදු කරන ලදී. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් නිර්ණායකයන් නොසලකා මාර්ග ඉදිකිරීමට අනුමත කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටස 48 පරිච්ඡේදයේ 29 වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2008 ඔක්තෝබර් 07 දිනැති අධිකාරියේ අධ්‍යක්ෂ මුදල් විසින් නිකුත් කරන ලද මූල්‍ය බලතල බෙදා හැරීමේ ලිපිය අනුව, මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයාට චෙක්පත් අත්සන් කිරීමේ මූල්‍ය සීමාව රු.මිලියන 10 ක් විය. නමුත් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී 2023 ජනවාරි මාසයේ සිට 2023 මැයි 31 දින දක්වා කාල සීමාව | රු.මිලියන 10 ඉක්මවා යන ගෙවීම් වලට අදාලව චෙක්පත් අත්සන් කිරීම සඳහා එම මූල්‍ය සීමාවට අයත් නිලධාරීන් සිටින ප්‍රධාන කාර්යාලයට එවිය යුතු අතර මේ හේතුවෙන් එම චෙක්පත් සඳහා අත්සන් ලබා ගැනීම වෙනුවෙන් විශාල කාලයක් මිඩංගු කිරීමට සිදු වේ. මෙම ප්‍රමාදය වලක්වා ගැනීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා මු.රෙ 135 අනුව විධිමත් මූල්‍ය බලතල අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ |

| | | | |
|---|---|---|---|
| | තුළ කොන්ත්‍රාත් බිල්පත් 95 කට අදාළව රු.මිලියන 1,572.31 ක් ගෙවීම් කර තිබුණු අතර එම සම්පූර්ණ වටිනාකම ගෙවීම සඳහා රු.මිලියන 10 කට වඩා අඩු වටිනාකමින් යුතුව චෙක්පත් 250 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇති බලතල සීමාව ඉක්ම නොයන ආකාරයට ගෙවිය යුතු වටිනාකම කුඩා වටිනාකම් වලට වෙන් කර චෙක්පත් අත්සන් කර තිබුණි. | සඳහා ඇතැම් අවස්ථාවලදී රු.මිලියන 10 කට වඩා අඩු චෙක්පත් නිකුත් කිරීම සිදු කර තිබුණි. | XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඔ) | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල විසින් මූල්‍ය ශක්‍යතාව හීන කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් ඇපවීම සිදු කරනු ලබන අතර, ඒ අනුව මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත්කරුවන් 22 දෙනෙකුට ලබා දී තිබුණු වැඩ පූර්ව අත්තිකාරම් වෙනුවෙන් මෙම අරමුදලින් අය විය යුතු රු.මි. 259.26 ක් අයකර ගැනීමට අධිකාරිය කටයුතුකර නොමැති අතර, අදාළ වටිනාකම තුළ වර්ෂ 2කට වැඩි කාලයක සිට කිසිදු කාර්යයක් ආරම්භ නොකල කොන්ත්‍රාත් පැකේජ 09 කට අදාළ රු.මි.115.94 ක්ද ඇතුළත්ව තිබුණි. | මේ වන විට මෙහි සඳහන් වැඩ පූර්ව අත්තිකාරම් සඳහා ගෙවන ලද මුදලින් පියවා ගැනීමට තිබූ මුදල වන රු. මිලියන 115.95 මුදල රු. මිලියන 52.73 දක්වා අඩු වී ඇත. ඉතිරි අයකර ගැනීමට ඇති මුදල අදාල කොන්ත්‍රාත්කරුට කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ ප්‍රධානය කරන ලද වෙනත් ව්‍යාපෘති මගින් අයකර ගැනීමට කටයුතු කර ඇත. | ගිවිසුම් කොන්දේසි කඩ කරණු ලබන කොන්ත්‍රාත්කරුවන්ගේ අයවීම් සම්බන්ධයෙන් කාර්යසාධන ඇපකර මුදල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීම, පළපුරුදු හා හැකියාව ඇති කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ ව්‍යාපෘතිය සඳහා අමුද්‍රව්‍ය සොයා ගැනීම වැනි දුෂ්කරතා පැවතීම හේතුවෙන් සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද මාර්ග කි.මී. 17,847 න් කි.මී. 11,549 ක් අතරමහ නතර කර තිබුණි. මාර්ග ඉදිකිරීම් සඳහා ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට දරන ලද වියදම රු.මිලියන 167,305 ක් වී තිබුණි. 2022 වර්ෂයේදී ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීමට ඇති බිල්පත් වටිනාකම හඳුනා ගෙන නොතිබුණි. | රට තුළ ඇති වූ ආර්ථික අර්බුදකාරී තත්වය හේතුවෙන් 2022 වසරේදී මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට තීරණය කරන ලද අතර 2023 වසර අවසාන වන විට කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු බිල්පත්වල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. | අධිකාරියේ විෂය එතයට අයත් නොවන මාර්ග ඉදිකිරීම සිදු නොකල යුතු අතර දැනට නිමකර ඇති අධිකාරියට අයත් නොවන මාර්ග අදාල පලාත් පාලන ආයතන වෙත පැවරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | 2020 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ අධිකාරිය විසින් ඉදිකිරීම් අරක්ෂණ අරමුදල වෙත රු.මිලියන 32,553.12 ක් නිදහස් කර තිබුණු අතර, එම මුදලින් රු.මිලියන 224.2 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අදාළ අරමුදල මගින් රඳවාගෙන තිබුණි. තවද, කොන්ත්‍රාත් 212 කට අදාළ රු. මිලියන1,492.82 ක වටිනාකමින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සහ රු.මිලියන 29.94 ක් වූ බිල්පත් සඳහා ගෙවීම් අරමුදලින් බැහැරව ඍජුව කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස්කර තිබුණු අතර එයින් රු.මිලියන 29.94 ක බිල්පත් ව්‍යාජ ඒවා බව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් අනාවරණය කර තිබුණි. | මූලික විමර්ශණයක් සිදු කරගෙන යන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) මඟින්ද විමර්ශණයක් සිදුකර ගෙන යනු ලබයි. එම විමර්ශණ ප්‍රතිපල අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත අතර දැනට සිදු වන ගෙවීම් වලදී අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කර ඇත. | ඵලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමටත් අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුකිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ග) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 5.3.4 වගන්තිය අනුව, මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය ආරම්භයේ දී සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලැබූ කි.මී 50 හා කි.මී. 100 මාර්ගවල දික්කඩයන් සහ හරස් කඩයන්වල මැණුම් කටයුතු සිදු කිරීම (Longitudinal & Cross Section Survey) සඳහා පුද්ගලික සමාගම වෙත එකතුව රු.මි.79.26 ක් වූ කි.මී. 50 කොන්ත්‍රාත් 10 ක්ද, එකතුව රු.මි. 121.45 ක් වූ කි.මී. 100 කොන්ත්‍රාත් 08ක් පිරිනමා තිබුණි. කෙසේ වෙතත් එම කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාළ කොන්ත්‍රාත් ආයතනය සතුව ඊට අවශ්‍ය උපකරණ පවතීද යන්න පිළිබඳ ඇගයීමක් තාක්ෂණික ඇගයීම් කමිටු විසින් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, අදාල කොන්ත්‍රාත්කරු වෙත පිරිනමා තිබුණු කොන්ත්‍රාත් ප්‍රමාණය සමස්ථ මැනුම් කි.මී. ප්‍රමාණය වූ 2975 න් සියයට 44 ක් වී තිබුණි. | මිනුම් කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන උපකරණ ලැයිස්තුව හා මිනුම් කටයුතුවලට සම්බන්ධ වන කාර්යය මණ්ඩලයේ සුදුසුකම් පිළිබඳවද පැහැදිලිව දක්වා ඇති අතර ඒවා සපුරා ඇති ආකාරය පිළිබඳව ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය ඇගයීමට ලක් කිරීමෙන් පසු තාක්ෂණික කමිටු වාර්තාව සකස් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් ඇගයීම හා පිරිනැමීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාලෙන විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ච) | ශ්‍රී ලංකා රජය හා කොරියානු ආනයන අපනයන බැංකුව සමඟ එකඟතාවයක් මත එ.ජ.ඩො.මිලියන 199.27 ක ණය මුදලක් නුවර උමං මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දීමටත් එම ණය මුදල ලබා ගන්නා දිනයේ සිට වසර 05 | පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවට අදාල අනුමැතිය නිකුත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරිය (CEA) මගින් දැනට ක්‍රියාත්මක කරමින් පවතී. නැවත පදිංචි කිරීමේ | පාරිසරික අධ්‍යයන වාර්තා වැඩකටයුතු නිමකිරීමෙන් පසු ජාතික සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

ක කාලයක් තුළ වැඩ අවසන් කිරීමට තීරණය කර තිබුණි. අදාළ ණය මුදල ලබා ගැනීම සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමක් ඇති කර ගැනීමට පෙර පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව (EIA) ලබා ගෙන ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව, ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95.75 ක් වූ පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය වෙත 2021 මාර්තු 25 දින බාර දී තිබුණු අතර, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත 2022 ඔක්තෝබර් 04 දින රු.මිලියන 8.47 කට පවරා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 88.11ක් ගෙවා තිබුණද, අදාළ කාර්යන් අවසන්කර නොතිබුණු අතර අදාළ ව්‍යාපෘතියේ කටයුතු අවසන්කර ඒ වන විට පැවති වගකීම් පියවීමට National Operationg Room තීරණය කර ඇති බැවින් ඒ බව අදාළ කොන්ත්‍රාත් කරුවන් වෙත දැන්වීමට 2023 දෙසැම්බර් 19 දින පැවති මහාමාර්ග අමාත්‍යාංශ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව අදාල ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැය නිෂ්කාර්යය පිරිවැයක් බව නිරීක්ෂණය කෙරේ.

සැලැස්ම (RAP) එය භාරගත් සමාගම මගින් 90% පමණ අවසන් කර ඇති අතර පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවට (EIA) අනුමැතිය ලැබෙනතුරු එය නිම කිරීම පමා කිරීමට උපදෙස් ලබා දී ඇත.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට පැවති අනුමත කාර්යය මණ්ඩලය 9,602 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 9,838 ක් විය. ඒ අනුව සේවක ඌනතාවය 620 ක් සහ අතිරික්තය 857 ක් වී තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමට අධිකාරිය කටයුතුකර නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය 9602ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 9838ක් ද බව නිවැරදි වන අතර සේවක ඌණතාවය 620ක් හා අතිරික්තය 857ක් ලෙස නිවැරදි විය යුතුය. | සේවක අවශ්‍යතාවය අනුව අනුමත කාර්යමණ්ඩලයක් පවත්වා ගැනීමට ගණන් දීමේ නිලධාරී කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයන්හි කාර්ය මණ්ඩලය සඳහා පරිපාලන අංශය විසින් වෙන්කරන ලද කළමනාකරණ සහකාර තනතුරු සංඛ්‍යාව 81 ක් වුවද, එදිනට එම අංශ වල සේවයේ නියුක්ත තථ්‍ය සේවක සංඛ්‍යාව 149 ක් විය. ඒ අනුව අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 68 ක් අදාළ අංශවල සේවය කරන බව නිරීක්ෂණය විය. තවද, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයේ මුදල් අයකැමිවරුන් සහ මුරසංචාරකවරුන් ලෙස පත්වීම් ලද එහෙත් කළමනාකරණ සහකාර තනතුරුවල තාවකාලිකව සේවය කරන සේවකයින් 24 දෙනෙකු අදාළ නිත්‍ය තනතුරු වෙත අනුයුක්තකර නොතිබුණි. | අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය සඳහා අනුමත කළමනාකරණ සහකාරවරුන් සංඛ්‍යාව 81 වුව ද එය ප්‍රමාණවත් නොවන අතර මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව සිදු කර ගෙන යාමට කළමනාකරණ සහකාර තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති මුදල් අයකැමිවරුන් හා මුර සංචාරකයන් කිහිපදෙනෙකු තාවකාලිකව කළමනාකරණ සහකාර තනතුරේ රාජකාරි වල යොදවා ගැනීමට කටයුතු කර ඇත. | අනුමත කාර්යමණ්ඩල සංඛ්‍යාවට වැඩියෙන් සේවකයින් බඳවාගත් නිලධාරීන් හඳුනාගෙන ආයතන සංග්‍රයේ ii කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 08 වන වගන්තිය අනුව කටයුතු කිරීමටත් අලාභ මුදල් රෙගුලාසි අනුව අයකර ගැනීමටත් කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගත හැකි වන ආකාරයෙන් වැඩ පිළිවෙලක් නිරූපනය නොවූ අතර අධිකාරිය විසින් | මාර්ග සංවර්ධන අධිකාරියට අදාලව හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන ඉලක්ක යටතේ 2030 වර්ෂය සඳහා අපේක්ෂිත අරමුණු අනුව සැලසුම්ගත ව්‍යාපෘති හා අදාල තිරසර දර්ශකයක් හා | තිරසර සංවර්ධන අරමුණු සැලසුම් අනුව ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |

හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ඉටු කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතින් මොනවාද යන්නත්, ඊට අදාළ තිරසර සංවර්ධන දර්ශකයන් (SDG Indicators) සහ වර්ෂය තුළ දී එම දර්ශකයන්ගේ අපේක්ෂිත කාර්යසාධනය වැනි නිර්ණායක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවුණි. එමෙන්ම 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර අරමුණු මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.

ඒවායේ අපේක්ෂිත වාර්ෂික කාර්යසාධනයද ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර ඇත.